// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2264/12 - 2022 ජනවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

නගර සභා ආඥාපනතේ 184 වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරවරයා විසින් සභාපතිවරයා ඉවත් කිරීම හේතුකොට ගෙන ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වැනි වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන වවුලන්බොක්ක ගමගේ ලලිත් ධර්මකීර්ති අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුහසිංහ පතිරණගේ දිනේෂ් මධුෂංඛ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ඇඹිලිපිටිය නගර සභාවේ තේරීම්භාර නිලධාරී සුරංග අඹගහතැන්නෙ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සුහසිංහ පතිරණගේ දිනේෂ් මධුෂංඛ, ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සුරංග අඹගහතැන්නෙ,
තේරීම්භාර නිලධාරී,
ඇඹිලිපිටිය නගර සභාව.

2022 ජනවාරි මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 01-0255



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතුකොට ගෙන ඇඹිලිපිටිය නගර සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වැනි වගන්තිය යටතේ තනතුර දරූ උප සභාපති වන සුහසිංහ පතිරණගේ දිනේෂ් මධුෂංඛ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ඇඹිලිපිටිය නගර සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඕලුගල විතාරමලාගේ සරත් විතාරන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ඇඹිලිපිටිය නගර සභාවේ තේරීම්භාර නිලධාරි සුරංග අඹගහතැන්නෙ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඕලුගල විතාරමලාගේ සරත් විතාරන, ඇඹිලිපිටිය නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරි,
ඇඹිලිපිටිය නගර සභාව.

2022 ජනවාරි මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 01-0256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.